# පොල්පිතිගම ප්‍රාදේශීය සභාව

-----------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශනඉදිරිපත්කිරීම

සමාලෝචිතවර්ෂයේ මූල්‍ය ප්‍රකාශන2012 මාර්තු 28 දින ද ඉකුත්වර්ෂයටඅදාල මූල්‍ය ප්‍රකාශන2011 මාර්තු 30 දින ද විගණනයටඉදිරිපත්කරතිබූඅතරසමාලෝචිතවර්ෂයේ විගණකාධිපති වාර්තාව2012 සැප්තැම්බර්12දිනසභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

### 1.2 මතය

මාගේපරීක්ෂණයෙන් පෙනීයනඅන්දමටසහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම්අනුවපොල්පිතිගම ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වර්ෂය සඳහා නිසිගිණුම්වාර්තා පවත්වා ඇති බවත්, සභාපතිවරයාට යවන ලද මාගේවාර්තාවේ දක්වා ඇතිකරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලටවන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනටපොල්පිතිගම ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳතත්ත්වය සහ එදිනෙන් අවසන්වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලසත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත්ගිණුම්කරණ මූලධර්ම වලටඅනුකූලව මූල්‍ය ප්‍රකාශනපිළියෙල කරඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශනපිළබඳඅදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණඅඩුපාඩු

ප්‍රධාන ලේකම්කාර්යාලයෙන් ලැබී තිබූ තොරතුරු අනුවසමාලෝචිතවර්ෂයටඅදාල උසාවි දඩ ආදායම රු.4,366,175 ක්වුවත් ආදායම් හා වියදම් ගිණුමේසමාලෝචිතවර්ෂයටඅදාල උසාවි දඩ රු.3,299,688 ක් දක්වා තිබුණෙන්සමාලෝචිතවර්ෂයටඅදාල උසාවි දඩ ආදායම රු.1,066,487 ක්අඩුවෙන්ගිණුම්ගතකරතිබුණි. එමෙන්ම සමාලෝචිතවර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.1,626,520 ක්වුවත්, එය ආදායම් ණය ගැතියෝ යටතේඑය රු.718,425 ක් ලෙසදැක්වීම හේතුවෙන්සමාලෝචිතවර්ෂය අවසානයට ආදායම් ණය ගැතියෝ රු.908,095 ක්අඩුවෙන්ගිණුම්ගතකරතිබුණි.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

තොරතුරු විගණනයටඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයටඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 30,401,486 ක්වූ ගනුදෙනුවිගණනයේදීසතුටුදායක ලෙසසන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශනඅනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.598,587 කවූ අතර, ඊටඅනුරූපීවඉකුත්වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,303,185 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලනඅඩුපාඩුනිරීක්ෂණය විය.

(අ). 2011 දෙසැම්බර් 31 දිනටරු.1,264,738 ක අවිනිශ්චිතස්වභාවයේ ගිණුම් හර ශේෂ පැවතුණි. එමෙන්ම විවිධකරුණු වෙනුවෙන් අවස්ථා 7 යටතේ ලැබී තිබුණු රු.814,622 ක්නිරවුල් නොකරසමාලෝචිතවර්ෂය අවසානය දක්වාම තැන්පතු යටතේ පැවතුණි.

(ආ). කොන්ක්‍රීට්ව්‍යාපෘතිඋපකරණගිණුමේවර්ෂ කීපයකසිටඉදිරියටඑන රු.333,115 ක ශේෂය හඳුනාගෙනතථ්‍ය අගය ගිණුම්වලට ගෙන නොතිබුණි. එමෙන්ම වර්ෂ ගණනාවක සිටඉදිරියට ගෙනඑමින් පවතිනගිණුම්විෂයන් 8 කටඅදාල රු345,497 ක ගිණුම් ශේෂයක්සමාලෝචිතවර්ෂය අවසානයටදනිරවුල්කර නොතිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින්සමාලෝචිතවර්ෂයටඅදාලවඉදිරිපත්කරතිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනටසමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු000' | රු.000' | රු.000' |
| (i). | වරිපනම් හා බදු | 11 | 15 | - |
| (ii). | බදුකුලී | 2,867 | 2,832 | 35 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 850 | 934 | - |
| (iv). | වෙනත් ආදායම් | 29,423 | 21,692 | 7,731 |

#### 2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත්සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත්බලධාරින්ගෙන්2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුවතිබූඋසාවි දඩ මුදල් රු.4,366,175 ක් විය.

2.4 <u>මානවසම්පත් කළමනාකරණය</u>

පහත නිරීක්ෂණයන්කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභාවේ ලේකම්තනතුර කළමනාකරණ සේවයේ අධි පංතියේ (සුප්‍රා) තනතුරක්වුවත් එය කළමනාකරණ සේවයේ පළමු පන්තියේ නිලධාරිණියකවිසින්වැඩ ආවරණය කරමින් පැවතුණි. පෙර පාසල්පාලිකා, කාර්මිකනිලධාරි, වැඩ පර්පාලකතනතුරු එකබැගින්ද පුස්තකාලාධිපති තනතුරු 2 ක්ද දීර්ඝකාලීනවපුරප්පාඩුව පැවතුණි.

(ආ). සුළු සේවක, මුරකරු, කම්කරු වැනිතනතුරු නාම යටතේඅනුමතතනතුරු සංඛ්‍යාව 35 ක්වූ අතරසමාලෝචිතවර්ෂය අවසන්වන විටඒ යටතේ 32 ක් සේවයේ යොදවා තිබුණි. එහෙත්අනියම් හා ආදේශකපදනම මත එහි තනතුරු නාම සඳහා සභාවෙන්වැටුප්ලබන සේවකයන් 8 දෙනෙකුසමාලෝචිතවර්ෂය අවසන්වන විටඅනුයුක්තව පැවතුණි.

2.5 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

ප්‍රාදේශීය සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති පළාත්පාලන විශ්‍රාම වැටුප්අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයින්ටඅදාලවසභාවවිසින්එකීඅරමුදලට ගෙවිය යුතු දායක මුදල්නිසිපරිදි නොගෙවීම නිසා සමාලෝචිතවර්ෂය අවසානය වන විටඑකීඅරමුදලට ගෙවිය යුතු ශේෂය රු. 1,763,992 වතිබුණි.

2.6 <u>අභ්‍යන්තරවිගණනය</u>

සමාලොචිත වර්ෂයට අදාළව අභ්‍යන්තර විගණන හා කළමනාකරණකමිටුවක් පත්කර නොතිබ අතරඅභ්‍යන්තරවිගණන වැඩසටහනක් යටතේප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක්දසිදුව නොතිබුණි.

3 <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන්පද්ධති හා පාලනක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පර්පාලනය

(ඈ) වත්කම් කළමණාකරණය

(ඉ) කොන්ත්‍රාත්පර්පාලනය